**<u>මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුරට</u>**
**<u>බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු නිර්ණායක</u>**

| | ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රයන් | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01.<br>ජ්‍යෙෂ්ඨතාවය<br>**ලකුණු 40** | ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරියෙකු ලෙස I වන ශ්‍රේණියේ වසර 03ක සක්‍රීය සේවා කාලය ඉක්මවා සම්පූර්ණ කර ඇති මුළු සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන අනුව ලකුණු ලබා දෙනු ලැබේ. | 40 |
| 02.<br>කුසලතාවය<br>**ලකුණු 60** | **<u>02.1 කාර්යය සාධන ඇගයුම්</u>**<br>අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වයෙන් වූ වසර පහක (05) කාල සීමාව තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම්වලින් ලබාගත් ශ්‍රේණිගත කිරීම් භාවිතා කරමින් ලකුණු ප්‍රදානය කෙරේ.<br>**(වසරකට ලකුණු 03 බැගින් වසර පහක් සඳහා ප්‍රදානය කරනු ලබන උපරිම ලකුණු 15)**<br>විශිෂ්ටයි - ලකුණු 03<br>සාමාන්‍යයට වඩා ඉහළින් - ලකුණු 02<br>සතුටුදායකයි - ලකුණු 01 | 15 |
| | **<u>02.2 තනතුරට අදාළව පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතියට වන දායකත්වය</u>**<br>02.2.1 ක්ෂේත්‍රයේ උන්නතියට අදාල ඉදිරිපත් කිරීම(Presentation) - (උපරිම ලකුණු 10)<br>නිලධාරියා විසින් පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතියට ඉටු කරන ලද රාජකාරි කටයුතු සම්බන්ධයෙන් පරිගණක ආශ්‍රයෙන් (Power point presentation) කරනු ලබන විනාඩි 10ක ඉදිරිපත් කිරීමක් වේ.<br>02.2.1.1 ඉදිරිපත් කරන කරුණු - ලකුණු 04<br>02.2.1.2 සැකසුම, නිර්මාණය, ඉදිරිපත් කිරීමේ විලාශය හා කාල කළමනාකරණය - ලකුණු 03<br>02.2.1.3 පරීක්ෂණ මණ්ඩලය යොමු කරන ගැටළු සඳහා දක්වන ප්‍රතිචාරය - ලකුණු 03<br>02.2.2 තනතුරට අදාළව පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතියට වන දායකත්වය හා ඉටුකරන ලද සුවිශේෂී කාර්යයන් - (උපරිම ලකුණු 05)<br>- පශු සම්පත් ක්ෂේත්‍රයට ලබා දී ඇති දායකත්වය<br>(එක් කාර්යයක් සඳහා ලකුණු 01 බැගින් වේ. ඉටු කරන ලද කාර්යය පිළිබඳව ආයතන ප්‍රධානියා මඟින් විස්තරාත්මක ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුයි.) | 15 |
| | **<u>02.3 සේවා පළපුරුද්ද /අදාල ක්ෂේත්‍රයේ අත්දැකීම්</u>**<br>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියට අයත් මධ්‍යම රජයේ / පළාත් රාජ්‍ය සේවයේ අධීක්ෂණ මට්ටමේ තනතුරක ස්ථිරව සේවය කර ඇත්නම් - වසරකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 05<br>(සේවය කරන ලද කාලය සම්බන්ධව ආයතන ප්‍රධානියා විසින් තහවුරු කරන ලද ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය) | 05 |
| | **<u>02.4 තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අධ්‍යාපන සුදුසුකම්</u>**<br>02.4.1 ආචාර්ය උපාධිය (Ph.D) ලකුණු 05<br>02.4.2 පශ්චාත් උපාධි M.Phil / MSc. By Research ලකුණු 04<br>02.4.3 පශ්චාත් උපාධි (MSc.) ලකුණු 03<br>02.4.4 පශ්චාත් උපාධි ඩිප්ලෝමා ලකුණු 02<br>(මෙහිදී ඉහලම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 05 |
| | **<u>02.5 වෙනත් සුදුසුකම්</u>**<br>02.5.1 පළාත්, ජාතික හා අන්තර්ජාතිකව ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණ - එකකට ලකුණු 03<br>02.5.2 ප්‍රශංසා ලිපි (පොදු 230 'බී' ආකෘතියේ) - එකකට ලකුණු 03<br>02.5.3 අන්තර්ජාතික හෝ ජාතික වැදගත්කමකින් යුතු ප්‍රකාශන - එකකට ලකුණු 03<br>02.5.4 අන්තර්ජාතික හෝ ජාතික විද්‍යාත්මක සඟරා වල පළ කරනු ලැබූ පත්‍රිකා<br>02.5.4.1 Full paper in peer reviewed journal, book chapters - ලකුණු 3<br>02.5.4.2 Extended abstract - ලකුණු 2<br>02.5.4.3 Abstract - ලකුණු 1.5<br>02.5.4.4 Newsletters / Leaflets etc. - ලකුණු 1<br>(ඉහත එක් එක් අවස්ථාව අතුරින් ඕනෑම අවස්ථාවක් සඳහා එක් අවස්ථාවකට ලකුණු 3 බැගින් උපරිම අවස්ථා 05ක් සඳහා මේ සඳහා අදාළ වන ලේඛන ඉදිරිපත් කළ යුතු අතර ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.) | 15 |
| | **<u>02.6 සම්මුඛ පරීක්ෂණයේදී දක්වන නිපුණතාවය</u>**<br>- නායකත්වය - ලකුණු 02<br>- සන්නිවේදන හැකියාව - ලකුණු 02<br>- පෞරුෂත්වය - ලකුණු 01 | 05 |
| | **<u>මුළු ලකුණු</u>** | 100 |